
# සමනල් පැටියා



ද්වානා රත්නායක

# සමනල් පැටියා

ද්වානා රත්නායක

# සමනල් පැටියා


## ද්වානා රත්නායක



**ISBN 978-624-206-740-7**


**කතෘගේ වෙනත් පොත් - වැහි බිඳුවක ගමන**
**වී ඇටයක කතන්දරේ**

**2023-12-18**

<u>**පිදුම**</u>

මාගේ ආදරණීය තාත්තාටත්, අම්මාටත්,
හැමවිටම මා දිරිමත් කරනා
මාගේ අත්තම්මාටත්,
මාගේ දඟ මල්ල නංගී අමීටත්, චූටි මල්ලී එවීටත්
ඉතා සෙනෙහසින් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එළදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශණයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශය අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කල "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.


මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල්වල දරුවන් යොමුකල විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කල සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

**ශෂිකලා සේනාධීර**
**විදුහල්පතිනිය**
**මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර**
**2023.11.01**

එකමත් එක කැලෑවක මල් වගේ
පාට පාට ලස්සන
සමනල් රංචුවක් සිටියා.



ඒ සමනල් රංචුවේ හිටපු පුංචි සමනලයෙක්
ගොඩක් ආස වුනේ කැලෑවේ තිබුණු
පුංචි පොකුණේ පිපිලා තිබුණ
හරි ලස්සන ඕලු මලට.




සමනල් රංචුවේ අනිත් සමනල්ලු කැලේ පිපුන ලස්සන මල් හොයාගෙන
ඇතට පියඹලා ගියත්
පුංචි සමනල් පැටියා හැම වෙලාවෙම හිටියේ
ඕලු මල ළඟින්මයි.
මේ දෙන්නා ගොඩක් යාළු වුණා.




මේ දෙන්නාගේ යාළුකම දැක්ක පොකුණේ හිටපු පුංචි මාළු
සතුටින් එහාට මෙහාට පිහිනුවා.






ඉර පායනකොට ඕලු මලේ පෙති දිගහැරිලා
හැමතැනටම සුවඳ පැතිරුණා.
සමනල් පැටියා මලට ආදරෙන් හෙමින් සැරේ එබිලා
පැණි බීලා බඩ පුරවා ගත්තා.




එක දවසක් කැලෑවේ ඇවිදින්න ආපු පුංචි බබාලා ටිකක්
මේ පොකුණ ළඟට ආවා.
එයාලා මේ ලස්සන ඕලු මල දැක්කා.
එයාලට පොකුණට බැහැලා මල බලන්න හිතුණා.




සමනල් පැටියා හොඳටම බය වුණා.
එයා හිතුවේ පුංචි ළමයි ඕලු මල කඩා ගනියි කියලා.



ඒත් ඒ බබාලා ගොඩක් හොඳ ළමයි එයාලා මල කැඩුවේ නැහැ.
එයාලා කිවුවේ "මල් පිපින්නේ පරිසරය ලස්සන කරන්න.
ඒක නිසා අපි මේ මල කඩන්නේ නැතිව
තියලා යමු" කියලා.



සමනල් පැටියට මේ කතාව ඇහුණා.
එයාට ගොඩක් සතුටු හිතුණා.
එයාගේ ලස්සන අත්තටු සලමින් රවුමක් පියෑඹුවා.
හරියට ස්තුතියි කියනවා වගේ.



සමනල් පැටියයි, ඕලු මලයි
පුංචි බබාලට ගොඩක් ආදරෙයි කියලා කිවුවා.

... නිමි ...



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්ව පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මාවිසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනාකරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුල ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘතිය රචනා කරන්නට විය. ඒ තුලින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් හා පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

**සෙනෙවිරත්න මහලේකම්**

**පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක**

**2023.11.01**